**ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන (අයි මාර්ග) -2017**

---

ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (අයි මාර්ග) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ලං.ර) හා ආසියානු සංවර්ධන බැංකුව (ඒ.ඩී.බී) අතර 2014 නොවැම්බර් 05 දින එළැඹි අංක 3171 එස්ආර්අයි(එස්එෆ්) අදියර 1 සඳහා වූ ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය, 2015 මැයි 28 දිනැති අංක 3221 සහ අංක 3222 අදියර 2 සඳහා ණය ගිවිසුම්, 2015 දෙසැම්බර් 11 දිනැති අංක 3225 සහ අංක 3226 අදියර 3 සඳහා වූ ණය ගිවිසුම් සහ 2017 දෙසැම්බර් 15 දිනැති අංක 3610 - එස්ආර්අයි(එස්එෆ්) අදියර 4 සඳහා වූ ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ වැඩසටහනේ කාලය

---

වැඩසටහනේ ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහා මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශයව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 117,780 සමාන එ.ජ.ඩො.මිලියන 906 ක් වන අතර ඉන් රු.මිලියන 104,000 සමාන එ.ජ.ඩො. මිලියන 800 ක් විවිධ කොටස් මූල්‍යාන පහසුකම් 06 ක් යටතේ සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉන් පළමු කොටස් 04 යටතේ රු. මිලියන 72,410 කට සමාන එ.ජ.ඩො. මිලියන 557 ක් මූල්‍යානය කිරීමට 2017 දෙසැම්බර් 31 දක්වා වෙනම ණය ගිවිසුම් 04 ක් අත්සන් කර තිබුණ අතර අනෙක් කොටස් 02 යටතේ රු.මිලියන 31,590 සමාන එ.ජ.ඩො. මිලියන 243 ක් මූල්‍යානය කිරීමට වෙනත් ණය ගිවිසුම් 2018 හා 2020 වර්ෂයන්හි අත්සන් කිරීමට අපේක්ෂිතය. ඉහත සඳහන් කරන ලද ණය ගිවිසුම් 04 අතරින් 02 වන කොටසේ 3222 ශ්‍රී(එස්එෆ්) සහ 03 වන කොටසේ 3326 ශ්‍රී(එස්එෆ්) දරන ණය ගිවිසුම් පිළිවෙලින් 2017 අප්‍රේල් 07 සහ 2017 මාර්තු 27 දින වසා දමා තිබුණි. වැඩසටහන එහි කටයුතු 2014 ජූනි 01 දින ආරම්භ කරන ලද අතර 2024 මාර්තු 30 වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය

විගණන සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලනයෙන් බලන කල වැඩසටහන කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම් වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහනේ වියදම්,මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම්වලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) විශේෂ (ඩොලර්)ගිණුමේ ආරම්භක ශේෂය හා එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම්, වැඩසටහන විසින් පවත්වාගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ලං.ම.බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව

(ඉ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(උ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයන්ට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේ ද යන බව, සහ

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්)ගිණුමේ ආරම්භක ශේෂය, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම්, වැඩසටහන විසින් පවත්වාගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ල.ම.බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණ බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

වැඩසටහනේ - අදියර II යටතේ කටයුතු ක්‍රියාත්මක කිරීමට දරන ලද රු.මිලියන 129.2 මුදලක් මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ වියදම් වශයෙන් දක්වා තිබුණි.

**2.2.2 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනතේ විධිවිධානයන්ට පටහැනිව වැඩසටහනේ අධීක්ෂණ උපදේශකවරුන් වෙනුවෙන් රු.මිලියන 60.60 උපයන විට බදු මුදල් වැඩ සටහන ගෙවා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ඇස්තමේන්තුවේ කරන ලද ප්‍රතිපාදනය | උපයෝජනය කරන ලද අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ. ඩො. මිලියන | රු.මිලියන |
| ආ.සං.බැ | 800 | 104,000 | 18,437.70 | 121.79 | 18,437.62 | 291.42 | 42,499.60 |
| ශ්‍රී.ලං.ර | 106 | 13,780 | 400.00 | -- | 185.20 | -- | 442.40 |
| | 906 | 117,780 | 18,837.70 | 121.79 | 18,622.82 | 291.42 | 42,942.00 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව, ණය සැපයීමේ නියෝජිතායතනය විසින් වෙන් කරන ලද රු.මිලියන 104,000 කට සමාන එ.ජ.ඩො.මිලියන 800 මුළු ප්‍රතිපාදනයෙන්, වැඩ සටහනේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීමෙන් වසර 3 ½ ගතවීමෙන් පසුව 2017 දෙසැම්බර් 31 දිනට මුළු ප්‍රතිපාදනයෙන් සියයට 36.3 ක් නියෝජනය කරමින් රු.මිලියන 42,499.6 කට සමාන එ.ජ.ඩො.මිලියන 291.42 මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් වැඩසටහනේ කාර්ය සටහන් සමාලෝචිත වර්ෂයේ විස්තරාත්මක අයවැය මත පදනම්ව පිළියෙල කර නොතිබුණි. එමනිසා සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව තුල වෙන් කරන ලද රු.මිලියන 400 මුදලින් රු.මිලියන 185 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

----------------------

වැඩසටහනෙහි මූලික සැලසුම්වලට අනුව, වැඩසටහන විසින් කිලෝමීටර 2,200 ග්‍රාමීය මාර්ග සහ කිලෝමීටර 4,400 කින් යුතු ජාතික මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව පැවති අතර එය අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව කිලෝමීටර 3,108 යුතු ග්‍රාමීය මාර්ග සහ කි.මී. 248 කින් යුතු ජාතික මාර්ග පුනරුත්ථාපනය වශයෙන් අවස්ථා 03 කදී එය සංශෝධනය කරන ලදී. කෙසේවෙතත්, වැඩසටහන දකුණ, සබරගමුව, මධ්‍යම, උතුරුමැද, වයඹ පළාත සහ බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කය තුල කිලෝමීටර 3,131 යුතු ග්‍රාමීය මාර්ග 740 ක් පුනරුත්ථාපනය කිරීමට පියවර ගෙන තිබුණි. තවද, ජාතික මාර්ගවල නිර්මිත සකස් කිරීමේ වැඩ සමාලෝචිත වර්ෂය අවසානයේ ආරම්භ කර තිබුණි. ඒ පිළිබඳ පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ලියකියවිලි අනුව, එමඟින් කොන්ත්‍රාත් පැකේජ 09 ක් යටතේ දකුණු පළාත තුල කිලෝමීටර 582 යුතු ග්‍රාමීය මාර්ග 162 පුනරුත්ථාපනය කිරීමට සැලසුම් කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම්වලට අනුව, 2017 මැයි 17 දිනට සියළුම ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීමට නියමිතව පැවතිනි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානයේ මාස 03 සිට 05 දක්වා ප්‍රමාද පරාසයක් සහිතව කොන්ත්‍රාත් පැකේජ 02 ක් යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කය තුල පමණක් මාර්ග පුනරුත්ථාපන වැඩ නිම කර තිබුණි. තවද, අනෙකුත් කොන්ත්‍රාත් පැකේජ 07 යටතේ දකුණු පළාත තුල කිලෝමීටර 500.03 ක් වූ ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන වැඩ නිමකිරීමට කාල දිගු ලබාදීමෙන් පසුව පවා කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය නිසාවෙන්, 2017 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත ඉලක්කයන්ට පසුපසින් පැවතිණ.

(ආ) වැඩසටහන විසින් 2017 දෙසැම්බර් 31 වන විට මධ්‍යම පළාතේ කිලෝමීටර 594.55 යුතු පළාත් සහ ග්‍රාමීය මාර්ග 126 ක් සහ සබරගමුව පළාතේ කිලෝමීටර 472.75 යුතු පළාත් හා ග්‍රාමීය මාර්ග 101 පුනරුත්ථාපනය කිරීමට සැලසුම් කර තිබුණද, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයේ මධ්‍යම පළාත තුල කිලෝමීටර 453.64 යුතු ග්‍රාමීය මාර්ග සහ සබරගමුව පළාත තුල කිලෝමීටර 238.72 යුතු ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන වැඩ පමණක් අඩ වශයෙන් නිම කර තිබුණි. තවද, මාතලේ දිස්ත්‍රික්කය තුල කිලෝමීටර 54.39 යුතු ග්‍රාමීය මාර්ග 32 ක් සහ කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක තුල කිලෝමීටර 238.22 යුතු ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන වැඩ භාරදීම් සම්බන්ධයෙන් කිසිඳු තොරතුරක් ලැබී නොතිබුණි.

(ඇ) කොන්ත්‍රාත් පැකේජ 08 ක් යටතේ වයඹ පළාත තුල කිලෝමීටර 691.64 යුත් ග්‍රාමීය මාර්ග 114 ක පුනරුත්ථාපන වැඩවල ප්‍රගතිය අපේක්ෂිත ඉලක්කයන්ට පසුපසින් පැවති අතර 2017 දෙසැම්බර් 31 වන විට ග්‍රාමීය මාර්ග 229 ක් පමණක් නිමකර තිබුණි. තවද, කොන්ත්‍රාත් පැකේජ 07 ක් යටතේ උතුරුමැද පළාත තුල කිලෝමීටර 503.34 යුතු ග්‍රාමීය මාර්ග 115 ක් පුනරුත්ථාපනය කිරීමේ වැඩ අපේක්ෂිත ඉලක්කයන්ට පසුපසින් පැවති අතර 2017 දෙසැම්බර් 31 දිනට කිලෝමීටර 222 යුතු ග්‍රාමීය මාර්ග නිමකර තිබුණි. මාර්ග පුනරුත්ථාපනය කිරීමේ භෞතික කාර්යසාධනය කොන්ත්‍රාත් පැකේජ 03 ක් යටතේ ඉතාමත් අඩු ප්‍රගතියක් වාර්තා කර තිබුණු අතර වැඩසටහන විසින් පුනරුත්ථාපන වැඩ කඩිනම් කිරීමට පිළියම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කය තුල කිලෝමීටර 277යුතු ග්‍රාමීය මාර්ග 83 පුනරුත්ථාපනය කිරීමේ කොන්ත්‍රාත් වැඩ කොන්ත්‍රාත් පැකේජ 03 යටතේ ප්‍රදානය කර තිබුණු අතර කොන්ත්‍රාත්කරුගේ

අපොහොසත්වීම් හේතුකොට ගෙන 2017 දෙසැම්බර් 31 දිනට එයින් කිලෝමීටර 48 යුතු ග්‍රාමීය මාර්ග පමණක් නිමකර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

ලැබුණු තොරතුරු අනුව, රු.මිලියන 71,979 ක ඇස්තමේන්තුගත පිරිවැයකට කොන්ත්‍රාත් පැකේජ 42 ක් යටතේ පළාත් හා ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත් පිරිනමා තිබුණ කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමේදී ඔවුන්ගේ මූල්‍යමය හා අනෙකුත් සම්පත් හැකියාවන් සලකා බැලීමෙන් තොරවපුනරුත්ථාපන වැඩ සඳහා සැලසුම් සකස්කිරීමේ අපොහොසත්වීම්, පිරිවැය ඇස්තමේන්තුවල නිරවද්‍ය නොවීම්, විධිමත් අධීක්ෂණයේ මඳකම යනාදි එවැනි කොන්ත්‍රාත් පරිපාලන දුර්වලතාවයන් මාර්ග පුනරුත්ථාපන වැඩවල මන්දගාමී ප්‍රගතියට ඍජුව බලපා ඇත. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** මාතර දිස්ත්‍රික්කය තුල ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩ සඳහා වන කාර්ය සටහන තුල ඇතුළත් අයිතම 13 ක් සංශෝධනය කර තිබුණ අතර ඉංජිනේරු ඇස්තමේන්තුවල සාවද්‍යතාවයන් හේතුවෙන් ඇස්තමේන්තුගත ප්‍රමාණයන් පුදුම සහගත ලෙස වැඩිවී තිබුණ බවට අනාවරණය විය. තවද, දකුණු පළාතේ මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක තුල ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා වන පිරිවැය ඇස්තමේන්තුවලට යථාරූපී නොවූ රේටයන් භාවිතාකිරීම හේතුවෙන් තවත් කොන්ත්‍රාත් පැකේජ 02 ක් යටතේ කරන ලද පිරිවැය ඇස්තමේන්තු රු.මිලියන 352 කින් වැඩිවී තිබුණි.

**(ආ)** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් සේවා නියුක්ත කර ඇති ඉංජිනේරුවරුන්ට සේවා උපකරණ සැපයීම හා ප්‍රසම්පාදනය කිරීමට දකුණු පළාත තුල ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපන වැඩවල නියැලී සිටින කොන්ත්‍රාත්කරුවන්ට ඉඩ ලබාදී තිබුණු අතර ඒ හා බැඳුණු පිරිවැය ප්‍රමාණපත්‍ර තුල ඇතුළත් කර ඇත. එමනිසා රු.මිලියන 466 මුදලක් එකවර ගෙවීමේ මුදලක් වශයෙන් ගෙවා තිබුණ අතර සපයන ලද සේවාවේ ස්වභාවය ඒ සම්බන්ධයෙන් භාවිතා කල රේටයන්ගේ විස්තර සනාථ කරගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ලැබී නොතිබුණි.

**(ඇ)** ද්‍රවශීලතා ගැටළු හේතුවෙන්, පළාත් 03 ක කොන්ත්‍රාත් පැකේජ 07 ක් යටතේ මාර්ග පුනරුත්ථාපන වැඩවල නිරතවී සිටින කොන්ත්‍රාත්කරුවෙක් නියමිත දිනට වැඩ නිමකිරීමට අපොහොසත්වී තිබුණි. ව්‍යාපෘතිය මුදල් ප්‍රවාහ කළමනාකරණය තුල ඇති ගැටළු මැඩපැවැත්වීමට ඊඑස්අසීආර්ඕඩබ්ලිව් (එස්ක්‍රෝ) නැමැති පහසුකිරීමේ වැඩසටහනක් සකස් කර ඇති අතර මාර්ග පුනරුත්ථාපන වැඩ නිමකිරීමට රු.මිලියන 700 ක් කොන්ත්‍රාත්කරුට මුදාහැර තිබුණි. කෙසේවෙතත්, වැඩ සටහන විසින් කොන්ත්‍රාත්කරුගේ මූල්‍ය සැලසුම් අධීක්ෂණය කිරීමට විධිමත් යාන්ත්‍රණයක් යොදාගෙන නොතිබුණි. තවද, ණය සැපයීමේ නියෝජිතායතනයේ අනුමැතිය ලබාගැනීමේ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

**(ඈ)** ජාතික මාර්ගවල මාර්ග කළමනාකරණ කොන්ත්‍රාත් සඳහා අධීක්ෂණය කිරීමේ උපදේශකවරුන් බඳවාගැනීමේ උපදේශක කොන්ත්‍රාත් මත එ.ජ.ඩො. මිලියන 626,030 ක අසම්භාව්‍ය වෙන්කිරීම් සහ අවිනිශ්චිත මුදල් සමඟ එ.ජ.ඩො.මිලියන 270,000 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් තීරණය කර තිබූ බවට නිරීක්ෂණය විය.

**(ඉ)** වැඩ සටහන විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 , 5.4.4 ඡේදය තුල දක්වා ඇති වැඩ ආරම්භකිරීමේ අත්තිකාරම් සුරැකුම් ගෙවීම සඳහා වන ලියකියවිල්ල තුල ඇතුළත් වගන්ති මඳක් වෙනස් කර හා භාවිතා කර තිබුණු බවට විගණනයට නිරීක්ෂණය විය. එමනිසා වැඩසටහන විසින් සියළුම ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් පැකේජ සඳහා ඉල්ලූ විට ද්‍රවශීල කිරීමට හැකිවන පරිදි කොන්දේසි විරහිත ඇප සුරැකුම් ලබාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්

වැඩසටහනේ අසාර්ථක කොන්ත්‍රාත්කරුවන්ගෙන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ආපසු අයකරගැනීමට ඇති හැකියාවේ සැකය විගණනයෙන් බැහැර කළ නොහැක.

**(ඊ)** කොන්ත්‍රාත් ගිවිසුමේ 3.1 (බී) (ii) සාමාන්‍ය කොන්දේසිවලට පටහැනිව, කොන්ත්‍රාත් පැකේජ අංක 02 හා අංක 03 යටතේ ප්‍රදානය කරන ලද දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කය තුල ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කිරීමේ වැඩවල රු.මිලියන 38.50 ක් විචලතා වැඩ කොන්ත්‍රාත් පැකේජ 01 යටතේ හිමිකම්පෑමට ඉඩ සලසා තිබුණ බවට නිරීක්ෂණය විය.

## 3.4 ආර්ථික නොවන ගනුදෙනු

---------------------------------------------

කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිවල උපවගන්ති 4.2 අනුව, කොන්ත්‍රාත් පැකේජ මත ඉදිරිපත් කරන ලද කාර්යසාධන සුරැකුම් මත ලියකියවිලි සකස්කිරීම සහ බැංකු ගාස්තු යනාදී පිරිවැය කොන්ත්‍රාත්කරුවන් ඔවුන් විසින්ම දැරිය යුතු වේ. කෙසේවෙතත්, ඉහත අවශ්‍යතාවයන්ට පටහැනිව ව්‍යාපෘතිය විසින් පිරිනමන ලද කොන්ත්‍රාත් පැකේජ 42 සඳහා වන ප්‍රමාණපත්‍ර තුල අයිතමයක් ඇතුලත්ව ඇති නිසා කොන්ත්‍රාත්කරුවන්ට කාර්යසාධන සුරැකුම් මත අදාල පිරිවැය ආවරණය කර ගැනීමට 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 608.50 ක මුදලක් ගෙවා තිබුණි. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් ලැබුණු තොරතුරු පරිදි මේ සම්බන්ධයෙන් වන සත්‍ය පිරිවැය රු.මිලියන 268.70 ක් පමණක් විය. වැඩ සටහනේ ප්‍රසම්පාදන විශේෂඥවරයා සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම් වේලාවේදී අවධානය යොමුකර නොතිබුණු බවට තවදුරටත් නිරීක්ෂණය විය.

## 3.5 මතභේදාත්මක ස්වභාවයේ කරුණු

---------------------------------------------

ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය තුල නිරතවී සිටින දේශීය කොන්ත්‍රාත්කරුවෙක් වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2016 සැප්තැම්බර් 05 දිනැති අංක ටීඅයිපී/ටීපී/08/53/2016-69 දරන චක්‍රලේඛය තුල සඳහන් සහනවලට අයුතු ලෙස හිමිකම් පා තිබුණ අතර මාර්ග පුනරුත්ථාපන වැඩ අවසන්වීමෙන් පසුව යන්ත්‍ර සහ උපකරණ ආදිය ප්‍රතිඅපනයනය කිරීමේ එකඟතාවය සහිතව රු.මිලියන 324 ක් වටිනා යන්ත්‍ර හා අනෙකුත් උපකරණ ආනයනය කර තිබුණි. කෙසේවෙතත්, වැඩසටහන කොන්ත්‍රාත් පැකේජ තුල දක්වා ඇති අපේක්ෂිත ක්‍රියාකාරකම් සඳහා මෙවැනි යන්ත්‍රවල භාවිතයන් අධීක්ෂණය කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් භාවිතා කර නොතිබුණි.

## 3.6 මූල්‍ය පාලන ගැටළු

----------------------------

වැඩසටහනෙන් ලද තොරතුරුවලට අනුව, ණය සැපයීමේ නියෝජිතායතනය විසින් 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය නොකල ණය මුදල් මත රු.මිලියන 46.2 කට සමාන එ.ජ.ඩො. 305,203 මුදලක් කැපකරු කොමිස් අයකර තිබුණි.